ගෘහභාණ්ඩ සහ සවිකිරීම්		72,970.34	61,145.70	25,239.00	3,225.00	197,304.00		533,656.84	48,913.00	57,431.00	-	999,884.88
කෘෂි උපතරණ		338,388.00				-		-			-	338,388.00
ආයුධ සහ උපකරණ කොටස්		25,936.00	60,838.68	23,633.00		114,954.00	24,446.00	7,363.00	117,458.00	89,721.00	-	464,349.68
ශබ්ද උපකරණ		-	78,184.58			465.00				78,185.00	-	156,834.58
ආරක්ෂක උපකරණ		11,000.00			23,700.00			10,000.00			-	44,700.00
ටයිල් පැලටි		2,190,700.08	7,185,425.35	1,252,938.00	3,420,746.00	2,369,804.00	2,012,859.00		2,030,958.00	333,282.00	-	20,796,712.43
		11,329,178.01	**22,382,972.81**	**3,979,625.91**	**8,071,834.21**	**13,830,660.07**	**15,175,014.27**	**9,623,493.08**	**3,974,222.88**	**3,705,338.97**	**-**	**92,072,340.21**
සඳහන් කළ අගය		**6,903,068.39**	**773,602.39**	**324,313.09**	**96,701.79**	**10,410.71**	**9,579,746.73**	**1,252,195.67**	**135,746,500.12**	**633,902.47**	**37,147,500.00**	**192,467,941.36**

ලංකා පිඟන් සංස්ථාව

2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

	සටහන්	එරගම	මහියංගණය	බිංගිරිය	ඇලයාපත්තුව	උස්වැව	යටියන	ප්‍රධාන කාර්යාලය	වැලඩ	ඔඩඩුසුඩාන්	බංගදෙණිය	2023.12.31 දිනට ශේෂය රු
8. ආයෝජන												
		-	-		-	-	-	-	-	-	-	-
ස්ථාවර තැන්පතු		-	-	-	-	-	-	16,670,000.00	-	-	-	16,670,000.00
		-	**-**	**-**	**-**	**-**	**-**	**16,670,000.00**	**-**	**-**	**-**	**16,670,000.00**
9. භාණ්ඩ තොගය												
මැටි සහ වැලි		244,220.68	3,629,433.23	516,645.00	2,796,539.40	738,884.53	2,949,715.87				-	10,875,438.71
නිමි භාණ්ඩ		5,844,716.54	7,862,281.80	1,732,345.20	38,610.00	11,099,085.68	4,465,476.92		89,259.36	861,018.40	-	31,992,793.90
ක්‍රියාත්මක වන කාර්යයන්		2,054,118.00	616,527.54	-	-	93,096.00	615,322.00		-	-	-	3,379,063.54
ලිපිද්‍රව්‍ය		69,742.40	50,154.72	38,070.10		19,221.56	17,492.80	70,863.47	1,681.00		-	267,226.05
දැව		350,260.00	-	-		-	-	-	-		-	350,260.00
පොදු තොගය		815,929.30	2,514,872.31	229,123.86	736,734.69	3,308,284.17	403,454.86	2,080.00	467,355.54	1,631,108.43	-	10,108,943.16
පළුදු වූ තොගය		36,310.69	28,079.46	-	61,770.00	35,466.86	11,974.80	1,500.00	50,539.08	-	-	225,640.89
		9,415,297.61	**14,701,349.06**	**2,516,184.16**	**3,633,654.09**	**15,294,038.80**	**8,463,437.25**	**74,443.47**	**608,834.98**	**2,492,126.83**	**-**	**57,199,366.25**
10. වෙළඳ සහ වෙනත් ණයගැතියෝ												
වෙළඳ ණයගැතියෝ		691,753.90		-		1,439,075.00	142,100.00	944,024.38		-	-	3,216,953.28
වෙනත් ණයගැතියෝ		-	-	-		-	-	412,854.00	-	-	-	412,854.00
ලංකා පිඟන් සංස්ථාව		-	-	-	-	-	-	-	-	-	312.00	312.00
සේවක අර්ථසාධක අරමුදල් අධිභාර-SRMC		-	-	-	-	-	-	2,316,853.29	-	-	-	2,316,853.29
ආශ්‍රිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු මුදල්		349,641,638.51	(200,272,973.99)	(100,869,315.85)	(212,909,502.34)	(170,831,455.89)	(146,007,157.38)	741,913,836.22	(161,672,249.81)	(17,601,670.52)	(81,391,148.93)	-
		350,333,392.41	**(200,272,973.99)**	**(100,869,315.85)**	**(212,909,502.34)**	**(169,392,380.89)**	**(145,865,057.38)**	**745,587,567.89**	**(161,672,249.81)**	**(17,601,670.52)**	**(81,390,836.93)**	**5,946,972.57**
11. අත්තිකාරම්, තැන්පතු සහ පෙරගෙවුම්												
ඇප තැන්පතු								17,601.90				17,601.90
ආදායම් සහ බදු ලැබීම්								1,221,666.00				1,221,666.00
ජනතා වතු සංවර්ධන මණ්ඩලය								5,000,000.00				5,000,000.00
වෙනත් තැන්පතු		177,875.00	411,880.00	43,500.00	332,400.00	232,000.00	560,404.00	135,996.00	538,820.00		179,000.00	2,611,875.00
කම්හල් අත්තිකාරම්			299,147.00							443,800.00		742,947.00
උත්සව අත්තිකාරම්			-	17,500.00				3,000.00		-		20,500.00
ණයට විකුණුම් - උළු සඳහා ණය		401,647.59	240,717.64		-	184,824.87	148,468.12	470,815.74		149,540.08		1,596,014.04
		579,522.59	**951,744.64**	**61,000.00**	**332,400.00**	**416,824.87**	**708,872.12**	**6,849,079.64**	**538,820.00**	**593,340.08**	**179,000.00**	**11,210,603.94**



ලංකා පිහන් සංස්ථාව

2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

	සටහන්	එරගම	මහියංගණය	බිංගිරිය	ඇලයාපත්තුව	උස්වැව	යටියන	ප්‍රධාන කාර්යාලය	වැලඩ	ඔඩඩුසුඩාන්	බංගදෙණිය	2023.12.31 දිනට ශේෂය රු
12.බැංකු සහ මුදල් ශේෂ												
බැංකුවේ ඇති මුදල් - මහජන බැංකුව		-		-				34,446.46		-	-	34,446.46
මහජන බැංකුව - නාරාහේන්පිට		-						(14,160,463.88)				(14,160,463.88)
අත්තිකාරම් ගිණුම		59,183.21	256,762.42	19,965.95		24,958.45	46,465.03	-		21,827.58	-	429,162.64
අතැති මුදල්								25,038.18		-	-	25,038.18
පෙර ගෙවුම්		613,798.01	109,999.44		-		670.00	306,912.00		-	-	1,031,379.45
		672,981.22	**366,761.86**	**19,965.95**	**-**	**24,958.45**	**47,135.03**	**(13,794,067.24)**	**-**	**21,827.58**	**-**	**(12,640,437.15)**
13. ප්‍රකාශිත ප්‍රාග්ධනය												
මහා භාණ්ඩාගාරය විසින් නිදහස් කරන ලද ප්‍රකාශිත ප්‍රාග්ධනය			840,000.00	1,000,000.00	-	-	-	800,000.00	-	-	-	2,640,000.00
		-	**840,000.00**	**1,000,000.00**	**-**	**-**	**-**	**800,000.00**	**-**	**-**	**-**	**2,640,000.00**
14. වෙනත් සංචිත												
වත්කම් සහ මාරුකිරීම් වල අගය		-	-	-	2,192,271.00	3,419,140.00	-	4,167,976.00	1,888,004.00	1,629,147.00	1,858,079.00	15,154,617.00
ප්‍රාග්ධන සංචිත		1,132,817.00	-	-	-	-	-	-	-	-	-	1,132,817.00
ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන අතිරික්තය		-	2,632,010.00	-	-	-	23,372,091.00	-	136,635,000.00	-	37,087,500.00	199,726,601.00
වෙනත් සංචිත		-	-	-	-	-	-	-	-	-	-	-
අමාත්‍යාංශ ප්‍රදාන		-	-	-	-	-	-	-	-	-	-	-
		1,132,817.00	**2,632,010.00**	**-**	**2,192,271.00**	**3,419,140.00**	**23,372,091.00**	**4,167,976.00**	**138,523,004.00**	**1,629,147.00**	**38,945,579.00**	**216,014,035.00**
15.රදළවාගත් ඉපයීම්												-
2023/01/01 දිනට ශේෂය		431,542,672.24	(175,168,477.52)	(98,282,500.79)	(225,352,139.09)	(157,310,786.28)	(151,148,895.91)	76,237,361.42	(162,618,281.93)	(17,091,359.01)	(83,010,375.97)	(562,202,782.84)
පෙර වර්ෂ සඳහා ගැළපීම්		(1,559,713.49)	65,083.50	-	14,273,519.00	(1,299,086.19)	(18,445.25)	35,049.50	-	-		11,496,407.07
2023 වර්ෂය සඳහා ලාභ /(අලාභ)		1,451,011.47	(13,124,126.89)	(1,198,169.66)	(571,201.42)	(4,580,939.15)	(4,163,523.95)	(22,060,672.85)	5,814,748.55	(1,856,783.83)	-	(40,289,657.73)
23/12/31 දිනට ශේෂය		**431,433,970.22**	**(188,227,520.91)**	**(99,480,670.45)**	**(211,649,821.51)**	**(163,190,811.62)**	**(155,330,865.11)**	**54,211,738.07**	**(156,803,533.38)**	**(18,948,142.84)**	**(83,010,375.97)**	**(590,996,033.50)**
							-					
16.දීර්ඝ කාලීන ණය (භාණ්ඩාගාරය)												
භාණ්ඩාගාර ණය- බනිජ වැලි සමාගමෙන් අත්තිකාරම්		-	-	-	-	-	-	387,275,583.05	-	-	-	387,275,583.05
		-	**-**		**-**	**-**	**-**	**387,275,583.05**	**-**	**-**	**-**	**387,275,583.05**
17. වෙන්කිරීම්												
පාරිතෝෂික වෙන්කිරීම්		3,652,399.08	779,905.00	-	-	2,756,675.38	1,948,188.99	3,620,990.00	-	355,182.50	-	13,113,340.95
විගණන ගාස්තු		-	-	-	-	-	-	3,499,009.00	-	-	-	3,499,009.00
සේවක භාරකාර අරමුදල් - අධිභාර		-	-	-	-	-	-	7,896,290.83	-	-	-	7,896,290.83
නීති ගාස්තු		-	-	-	-	-	-	145,500.00	-	-	-	145,500.00
වෛද්‍ය දීමනා		181,005.93	133,070.81	-	39,028.00	268,746.80	169,597.64	401,549.69	-	24,744.20	-	1,217,743.07
		3,833,405.01	**912,975.81**	**-**	**39,028.00**	**3,025,422.18**	**2,117,786.63**	**15,563,339.52**	**-**	**379,926.70**	**-**	**25,871,883.85**
												-

ලංකා පිඟන් සංස්ථාව

2023 දෙසැම්බර් **31** දිනට මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

	සටහන්	එරගම	මහියංගණය	බිංගිරිය	ඇලයාපත්තුව	උස්වැව	යටියන	ප්‍රධාන කාර්යාලය	වැලඩ	ඔඩ්ඩුසුඩාන්	බංගදෙණිය	**2023.12.31** දිනට ශේෂය
												රු
18. බදු අයකිරීම් සඳහා වෙන්කිරීම්												
ව්‍යාපාර පිරිවැටුම් බදු		-	-	-	-	-	-	5,583,754.00	-	-	-	5,583,754.00
ආරක්ෂක බද්ධ		-	-	-	-	-	-	38,406,285.00	-	-	-	38,406,285.00
ජාතිය ගොඩනැඟීමේ බදු		-	-	-	-	-	-	5,056,579.00	-	-	-	5,056,579.00
එකතු කළ අගය මත බද්ධ		-	-	-	-	-	-	52,244,967.00	-	-	-	52,244,967.00
හාණ්ඩහා සේවා බද්ධ		-	-	-	-	-	-	59,488,623.00	-	-	-	59,488,623.00
මුද්දර බද්ධ		20,300.00	5,625.00	875.00	1,325.00	11,525.00	5,000.00	11,425.00	225.00	1,100.00	-	57,400.00
රදවා ගැනීමේ බදු		-	-	-	-	-	-	2,230,844.48	-	-	-	2,230,844.48
ආර්ථික සේවා ගාස්තු		-	-	-	-	-	-	11,002,254.00	-	-	-	11,002,254.00
		20,300.00	**5,625.00**	**875.00**	**1,325.00**	**11,525.00**	**5,000.00**	**174,024,731.48**	**225.00**	**1,100.00**	**-**	**174,070,706.48**
19. වෙළඳ සහ වෙනත් ණයගිම්යෝ												
වෙළඳ ණයගිම්යෝ				-	-	-	-	-		-	-	-
වෙනත් ණයගිම්යෝ		138,345.00			-	-	-		-	-	-	138,345.00
ලංකා පිඟන් සංස්ථාව			-	-	-	-	-	26,226,152.00	-	-	-	26,226,152.00
ලංකා බහිජතෙල් නීතිගත සංස්ථාව			-	-	-	-	-	6,093,775.00	-	-	-	6,093,775.00
ටෙන්ඩර් තැන්පතු		84,000.00			-	-			-	-	-	84,000.00
රැඳවුම් මුදල්				-	-	-	-		-	-	-	-
සේවක ඇප තැන්පතු			-	-	-	-	-	-	-	-	-	-
වෙළඳ තැන්පතු/		3,000,000.00		-	-		-	-	-	-	-	3,000,000.00
විකුණුම් අත්තිකාරම්		4,179,231.32	1,352,837.70	-	-	481,149.04	-	-	-	-	-	6,013,218.06
		7,401,576.32	**1,352,837.70**	**-**	**-**	**481,149.04**	**-**	**32,319,927.00**	**-**	**-**	**-**	**41,555,490.06**
20. උපචිත වියදම්												
ගෙවියයුතු සේවක භාරකාර අරමුදල්		669,291.60	199,247.95			397,771.87	276,860.59	649,918.29		55,315.85	-	2,248,406.15
ගෙවියයුතු සේවක අර්ථසාධක අරමුදල්		13,295.80	3,800.58			6,705.15	5,564.93	13,021.86		1,065.55	-	43,453.87
ගෙවියයුතු වැටුප්		171,441.44	8,960.00					131,200.00			-	311,601.44
උපචිත විදුලි වියදම්		1,614,404.39	2,850,600.20	79,605.07	4,305.40	170,871.82	85,797.32	66,798.14	7,704.74	61,243.09	-	4,941,330.17
උපචිත ජල සහ විලි වියදම්		266,983.65	77,388.98	2,000.00	13,178.40	2,000.00	8,239.18	196,401.85		2,278.97	-	568,471.03
ගෙවියයුතු කම්කරු වැටුප්		508,740.00	1,145,232.96				17,300.00	96,311.71			-	1,767,584.67
විවිධ		2,079,185.00	1,927,194.00	8,678.01	37,775.00	89,460.00	20,480.00	371,132.00	1,260.00	6,770.00	-	4,541,934.01
		5,323,341.88	**6,212,424.67**	**90,283.08**	**55,258.80**	**666,808.84**	**414,242.02**	**1,524,783.85**	**8,964.74**	**126,673.46**	**-**	**14,422,781.34**
												-

ලංකා පිහන් සංස්ථාව
සටහන් සඳහා උපලේඛන
උපලේඛන අංක 01

ණයගැතියන් විශ්ලේෂණය කිරීම 2023

කර්මාන්තශාලාව	අවුරුදු 1 ට අඩු	අවුරුදු 1-2	අවුරුදු 2-3	අවුරුදු තුනට වැඩි	එකතුව
එරගම කම්හල					
ගොඩනැඟිලි ද්‍රව්‍ය සංස්ථාව				593,490.00	593,490.00
එස්.නිරංජනරාජා	98,263.90			-	
	98,263.90		-	**593,490.00**	**593,490.00**
උස්වැව කම්හල		-			
ගොඩනැඟිලි ද්‍රව්‍ය සංස්ථාව	-	-		1,439,075.00	1,439,075.00
		-	-	**1,439,075.00**	**1,439,075.00**
යටියන කම්හල					
ගොඩනැඟිලි ද්‍රව්‍ය සංස්ථාව				142,100.00	142,100.00
				142,100.00	**142,100.00**
ප්‍රධාන කාර්යාලය				944,024.38	944,024.38
				944,024.38	**944,024.38**
වෙළඳ ණයකරුවන්					
	98,263.90			**3,118,689.38**	**3,216,953.28**
ප්‍රධාන කාර්යාලය					
SRMC				2,316,853.29	2,316,853.29
ෂෝ ටයිල් ෆැක්ටරි				401,354.00	401,354.00
එම්.ටී.නෙට්වර්ක්				1,500.00	1,500.00
දැව සංස්ථාව				10,000.00	10,000.00
	-			**2,729,707.29**	**2,729,707.29**
බංගදෙණිය					-
				312.00	**312.00**
වෙනත් ණය ගැතියන්		-	-	**2,730,019.29**	**2,730,019.29**
එකතුව	**98,263.90**			**5,848,708.67**	**5,946,972.57**

ලංකා පිහන් සංස්ථාව
සටහන් සඳහා උපලේඛන
උපලේඛන අංක 02

වෙළඳ සහ අනෙකුත් ණය හිමියන්

කර්මාන්තශාලාව	අවුරුදු 1 ට අඩු	අවුරුදු 1-2	අවුරුදු 2-3	අවුරුදු තුනට වැඩි	එකතුව
ප්‍රධාන කාර්යාලය					
ලංකා පිහන් සංස්ථාව	-	-	-	26,226,152.00	26,226,152.00
				26,226,152.00	**26,226,152.00**
ප්‍රධාන කාර්යාලය					
ලංකා බනිජ තෙල් සංස්ථාව	-	-	-	6,093,775.00	6,093,775.00
				6,093,775.00	**6,093,775.00**
එකතුව				**32,319,927.00**	**32,319,927.00**

ලංකා පිහන් සංස්ථාව
සටහන් සඳහා උපලේඛන
උපලේඛන අංක 03

ඇප තැන්පතු

කර්මාන්තශාලාව	අවුරුදු 1 ට අඩු	අවුරුදු 1-2	අවුරුදු 2-3	අවුරුදු තුනට වැඩි	එකතුව
ප්‍රධාන කාර්යාලය					
මහජන බැංකුව - කිරුළපන	-		17,601.90	-	17,601.90
එකතුව	**-**	**-**	**17,601.90**	**-**	**17,601.90**

ලංකා පිහන් සංස්ථාව
සටහන් සඳහා උපලේඛන
උපලේඛන අංක 04

වෙනත් තැන්පතු

කර්මාන්තශාලාව	අවුරුදු 1 ට අඩු	අවුරුදු 1-2	අවුරුදු 2-3	අවුරුදු තුනට වැඩි	එකතුව
එරගම කම්හල					
ලංකා විදුලිබල මණ්ඩලය				**177,875.00**	**177,875.00**
මහියංගණය කම්හල					
ලංකා විදුලිබල මණ්ඩලය				226,000.00	226,000.00
සිලෝන් ඔක්සිජන් ලිමිටඩ්				15,880.00	15,880.00
දැව සංස්ථාව				130,000.00	130,000.00
ඇකිරියන් කුඹුර				40,000.00	40,000.00
එකතුව				**411,880.00**	**411,880.00**
බිංගිරිය කම්හල					
ලංකා විදුලිබල මණ්ඩලය				40,500.00	40,500.00
ජාතික පශු සම්පත් මණ්ඩලය				3,000.00	3,000.00
එකතුව				**43,500.00**	**43,500.00**
ඇලයාපත්තුව කම්හල					
ලංකා විදුලිබල මණ්ඩලය				185,000.00	185,000.00
සිලෝන් ඔක්සිජන් ලිමිටඩ්				10,900.00	10,900.00
ලංකා විදුලිබල මණ්ඩලය				124,100.00	124,500.00
ජාතික ජල මණ්ඩලය				2,000.00	2,000.00
ජාතික පශුසම්පත් සංවර්ධන මණ්ඩලය				10,000.00	1,000.00
එකතුව				**332,000.00**	**323,400.00**
උස්වැව කම්හල					
ලංකා විදුලිබල මණ්ඩලය				222,000.00	222,000.00
දැව සංස්ථාව				10,000.00	10,000.00
එකතුව				**232,000.00**	**232,000.00**
යටියන කම්හල				-	-
විස්තර නොමැත				**560,404.00**	**560,404.00**
ප්‍රධාන කාර්යාලය				-	
ජාතික ඉතිරිකිරීමේ බැංකුව				12,004.50	12,004.50
ප්‍රධාන කාර්යාලය - ගබඩා		45,000.00			45,000.00
සිලෝන් ඔක්සිජන් ලිමිටඩ්				26,520.00	26,520.00
දැව සංස්ථාව				27,471.50	27,471.50
සෙල්ටෙල් ෆෝන් ඩිපොසිට්				1,500.00	1,500.00
අබාන්ස්				1,500.00	1,500.00
ඩයලොග් ටෙලිකොම්				8,000.00	8,000.00
වනජීවී දෙපාර්තමේන්තුව				1,000.00	1,000.00
විජිත ජයතිලක				12,000.00	12,000.00
මධ්‍යම සංස්කෘතික අරමුදල				1,000.00	1,000.00
එකතුව		**45,000.00**		**90,996.00**	**135,996.00**
වැලඩ කම්හල					
විස්තර නොමැත				**538,820.00**	**538,820.00**
ඔඩ්ඩුසුඩාන් කම්හල					
බංගදෙණිය කම්හල				**179,000.00**	**179,000.00**
විස්තර නොමැත					
එකතුව	**-**	**45,000.00**		**2,566,475.00**	**2,611,475.00**

ලංකා පිහන් සංස්ථාව
සටහන් සඳහා උපලේඛන
උපලේඛන අංක 05

	කම්හල් අත්තිකාරම්				
මහියංගණය	299,147.00				
එකතුව	**299,147.00**				

උපලේඛන අංක 06

උළු සඳහා ණය

කර්මාන්තශාලාව	අවුරුදු 1 ට අඩු	අවුරුදු 1-2	අවුරුදු 2-3	අවුරුදු තුනට වැඩි	එකතුව
ප්‍රධාන කාර්යාලය					
කේ.එච්.පී.දිල්හාරා	110,981.68	-			110,981.68
එච්.එම්.අයි ද සිල්වා		182,974.24		-	182,974.24
ආර්.එම්.එස්.ඒ.රත්නායක				71,907.04	71,907.04
ජේ.ඒ.එන්.ඩී.ජේ.මැණිකේ				23,038.21	23,038.21
පී.එච්.ඩී.සංජීව				56,315.48	56,315.48
ඩබ්ලිව්.එස්.විජේසිරි				25,598.00	25,598.00
	110,981.68	**182,974.24**	**-**	**176,858.73**	**470,814.65**
එරගම කම්හල					
බී.ජී.පී.පලිහක්කාර	-			38,385.00	38,385.00
ඒ.එම්.සුනිල්				58,667.00	58,667.00
ජී.රත්නසිරි	62,425.00			-	62,425.00
පී.කේ.සුනිල්	-			25,590.00	25,590.00
එච්.එම්.සුරංජිත් වන්දන	216,581.68				216,581.68
	279,006.68	**-**	**-**	**122,642.00**	**401,648.68**
මහියංගණය කම්හල					
එච්.එච්.එස්.ජී.අබේසේකර	-			38,396.95	38,396.95
එස්.එල්.ඉන්දික උදයකුමාර	-			53,755.69	53,755.69
	-	**-**	**-**	**92,152.64**	**92,152.64**
උස්වැව කම්හල					
යූ.පී.සමරසිංහ	-			28,157.79	28,157.79
එන්.ඒ.සමන් ප්‍රියන්ත	-	148,565.00	-		148,565.00
ඩී.එච්.එන්.දුලංජලී	-			30,717.58	30,717.58
ඩබ්ලිව්.ඒ.වමින්ද ලක්ප්‍රිය			125,949.50		125,949.50
	-	**148,565.00**	**125,949.50**	**58,875.37**	**333,389.87**
යටියන කම්හල	-	-			
ඩී.පී.කේ.විජේනායක			56,315.48	-	56,315.48
ආර්.ඒ.සී.නයනකාන්ති	-		48,636.11	-	48,636.11
දිස්නා කාන්ති			43,516.53		43,516.53
	-	**-**	**148,468.12**	**-**	**148,468.12**
ඔඩ්ඩුසුඩාන් කම්හල					
මනෝජ් අබේවික්‍රම		149,540.08			149,540.08
		149,540.08		**-**	**149,540.08**
එකතුව	**389,988.36**	**481,079.32**	**274,417.62**	**450,528.74**	**1,596,014.04**

ලංකා පිහන් සංස්ථාව

සටහන් සඳහා උපලේඛන

උපලේඛන අංක 12

	විගණනය සඳහා වෙන්කිරීම්				
ප්‍රධාන කාර්යාලය					එකතුව
	2004 / 2005			179,727.00	179,727.00
	2006/ 2012			990,855.00	990,855.00
	2016			89,457.00	89,457.00
	2017			532,970.00	532,970.00
	2019			200,000.00	200,000.00
	2022			651,000.00	651,000.00
	2023			855,000.00	855,000.00
එකතුව				**3,499,009.00**	**3,499,009.00**

ලංකා පිඟන් සංස්ථාව
සටහන් සඳහා උපලේඛන
උපලේඛන අංක 15

වෙළඳ නියෝජිත තැන්පතු

එරගම කම්හල - උළු අලෙවි නියෝජිත	අවුරුදු 1 ට අඩු	අවුරුදු 1-2	අවුරුදු 2-3	අවුරුදු තුනට වැඩි	එකතුව
ඒ.ඒ.කබීර්	-	-	-	500,000.00	500,000.00
එම්.ඒ.ටයිල්	-	-	-	500,000.00	500,000.00
එම්.අයි.මීරාන්	-	-	-	500,000.00	500,000.00
එස්.නිරන්ජන්රාජා	-	-	-	500,000.00	500,000.00
ඉස්මයිල් වෙළඳසැල්	-	-		500,000.00	500,000.00
එස්.එම්.රුක්ෂාන්	-	-		500,000.00	500,000.00
එකතුව		**-**	**-**	**3,000,000.00**	**3,000,000.00**

උපලේඛන අංක 16

2023- අත්තිකාරම් මත විකුණුම්

එරගම කම්හල	අවුරුදු 1 ට අඩු	අවුරුදු 1-2	අවුරුදු 2-3	අවුරුදු තුනට වැඩි	එකතුව
බෝසත් පාරමිතා	47,753.75				47,753.75
රී සුමන මහමෙව්වාව.	200,000.00				200,000.00
අයි.ෂස්මි	2,127,100.00				2,127,100.00
ටයිල් නියෝජිතයා	1,354,377.57				1,354,377.57
සෝමාවති	450,000.00	-	-		450,000.00
	4,179,231.32	**-**	**-**		**4,179,231.32**
උස්වැව කම්හල					
	481,149.04		-	-	481,149.04
	481,149.04	**-**	**-**	**-**	**481,149.04**
මහියංගණය කම්හල					
	1,352,837.70		-	-	1,352,837.70
	1,352,837.70	**-**	**-**	**-**	**1,352,837.70**
එකතුව	**6,013,218.06**	**-**	**-**	**-**	**6,013,218.06**

ලංකා පිඟන් සංස්ථාව

2023 දෙසැම්බර් අවසානයේ දී විශ්‍රාම පාරිතෝෂික සඳහා වෙන්කිරීම්

කම්හල		E.P.F. අංකය	නම	වසර ගණන	වැටුපේන් අඩුකළ EPF	මූදල	2022	2023
ප්‍රධාන කාර්යාලය	1	13051	එම්.එම්.ඉන්දජිත් ද සිල්වා	26	48,790.00	634,270.00	601,625.00	32,645.00
	2	13189	ආර්.එම්.එස්.ඒ.රත්නායක	26	62,686.00	814,918.00	769,700.00	45,218.00
	3	13471	පී.එච්.දිනේෂ් සංජීව	20	62,686.00	626,860.00	584,972.00	41,888.00
	4	12916	කේ.එච්.පී.දිල්හාරා	28	44,356.00	620,984.00	592,893.00	28,091.00
	5	13343	ජේ.ඒ.එන්.ඩී.ජේ.මැණිකේ	22	40,636.00	446,996.00	422,646.00	24,350.00
	6	13586	ඩබ්ලිව්.සීතා විජේසිරි	17	42,172.00	358,462.00	334,304.00	24,158.00
	7	13708	පී.ඒ.ප්‍රදීප් වසන්ත	6	39,500.00	118,500.00	62,102.50	56,397.50
			එකතුව		**340,826.00**	**3,620,990.00**	**3,368,242.50**	**252,747.50**
එරගම	8	13088	පී.ජී.පී.පලිහක්කාර	26	50,110.00	651,430.00	618,125.00	33,305.00
	9	12702	පී.කේ.සුනිල් පලිවත්ත	37	37,870.00	700,595.00	671,292.00	29,303.00
	10	13234	එච්.එම්.සුරංජිත් චන්දන	23	40,636.00	467,314.00	439,604.00	27,710.00
	11	13394	ඩී.බී.ප්‍රදීප් කුමාර	20	35,478.00	354,780.00	335,456.88	19,323.12
	12	13253	වී.පී.සරත් බණ්ඩාර	23	35,478.00	407,997.00	388,423.75	19,573.25
	13	13399	ජී.රත්නසිරි	21	36,700.00	385,350.00	362,920.00	22,430.00
	14	13395	ඒ.එම්. සුනිල් ප්‍රියන්ත	20	35,478.00	354,780.00	335,456.88	19,323.12
		13600	ඩබ්ලිව්.විමලසිරි	17	38,841.54	330,153.09	241,741.84	88,411.25
			එකතුව		**310,591.54**	**3,652,399.09**	**3,393,020.35**	**259,378.74**
මහියංගණය	15				-	-		-
	17	13237	එස්.එල්.ඉන්දික උදයකුමාර	23	38,326.00	440,749.00	418,748.00	22,001.00
	18	13534	එච්.ඩබ්ලිව්.එස්.ඩී.අබේසේකර	18	37,684.00	339,156.00	317,866.00	21,290.00
			එකතුව		**76,010.00**	**779,905.00**	**736,614.00**	**43,291.00**
යටියන	20	13327	ජේ.ඒ.සුජීව	22	35,478.00	390,258.00	370,768.13	19,489.87
	21	13403	ඒ.බී.ජයන්ත	20	35,144.50	351,445.00	332,452.50	18,992.50
	22	13235	ඩී.පී.කේ.විජේනායක	23	38,260.00	439,990.00	417,692.00	22,298.00
		13477	ඩබ්ලිව්.එල්.දිස්නා කාන්ති	19	37,972.00	360,734.00	339,156.00	21,578.00
	23	13365	ආර්.ඒ.සී.නයනකාන්ති	21	38,644.00	405,762.00	382,600.00	23,162.00
			එකතුව		**185,498.50**	**1,948,189.00**	**1,842,668.63**	**105,520.37**
උස්වැව	25	13525	ඩබ්ලිව්.ඒ.වමින්ද ලක්ප්‍රිය	18	36,334.00	327,006.00	307,360.00	19,646.00
	25	13265	යූ.පී.සමරසිංහ	23	43,708.00	502,642.00	476,564.00	26,078.00
	27	13460	එච්.ඒ.ජයරත්න	19	35,311.25	335,456.88	316,300.50	19,156.38
	28	13459	පී.එල්.දීප්ති	19	34,995.00	332,452.50	313,609.50	18,843.00
	29	13411	ඒ.පී.ගුණසිරි	20	35,478.00	354,780.00	335,456.88	19,323.12
	30	12846	සමන් පියරත්න	28	41,716.00	584,024.00	557,982.00	26,042.00
	31	13587	ඩී.එච්.එන්.දුලංජලී	17	37,684.00	320,314.00	295,232.00	25,082.00
			එකතුව		**265,226.25**	**2,756,675.38**	**2,602,504.88**	**154,170.50**
ඔඩ්ඩුසුඩාන්	32	13237	මනෝජ් අබේවික්‍රම	20	35,518.25	355,182.50	335,839.25	19,343.25
			එකතුව		**35,518.25**	**355,182.50**	**335,839.25**	**19,343.25**
			මුළු එකතුව		**1,213,670.54**	**13,113,340.97**	**12,278,889.61**	**834,451.36**

ලංකා පිඟන් සංස්ථාව
සටහන් සඳහා උපලේඛන
අංක 15 උපලේඛනය

		රඳවාගත් ඉපයීම්
එරගම කම්හල	**J/No**	මුදල
අභ්‍යන්තර මාරු කිරීම	J/12/1285	(396,109.49)
අභ්‍යන්තර මාරු කිරීම	J/12/1285	(433,450.00)
අභ්‍යන්තර මාරු කිරීම	J/12/1287	(735,700.00)
වෛද්‍ය බෝනස්	J/12/1312	5,546.00
		(1,559,713.49)
මහියංගණය කම්හල	**J/No**	මුදල
වෛද්‍ය බෝනස්	J/1313	65,083.50
		65,083.50
ඇලයපත්තුව		
වෛද්‍ය බෝනස්	J/12/1311	18,986.00
SRMC	J/12/1344	13,254,533.00
අමාත්‍යාංශ ප්‍රදානය	J/12/1345	1,000,000.00
		14,273,519.00
උස්වැව කම්හල	**J/No**	මුදල
අභ්‍යන්තර මාරු කිරීම	J/1/58W	(1,471,641.94)
වෛද්‍ය බෝනස්	J/12/1314	172,555.75
		(1,299,086.19)
ප්‍රධාන කාර්යාලය	**J/No**	මුදල
වෛද්‍ය බෝනස්	J/12/310	35,049.50
		35,049.50
යටියන කම්හල	**J/No**	මුදල
අභ්‍යන්තර මාරු කිරීම	J/328	(40,455.00)
වෛද්‍ය බෝනස්	I/327	22,009.75
		(18,445.25)
		11,496,407.07

සමාගමට එරෙහිව අධිකරණයේ ගොනු කරඇති නඩු සහ පාර්ශවකරුවන් සහ සේවකයින් විසින් සම්බන්ධ නෛතික විමර්ශන / නඩු

2023.12.31 දිනට කෙටි විස්තරය

අංකය	නඩුවෙහි අනු අංකය/ ගොනු අංකය	දිනය	විස්තරය
01	L – 168 අක්කරෙයිපත්තු දිස්ත්‍රික් උසාවිය ඉඩම් නඩුව	2007 වර්ෂයේ අභියාචනය ගොනුකර තිබේ.	බාහිර පුද්ගලයෙකු විසින් එරගම කම්හලට අයත් ඉඩමේ කොටසක් අල්ලා ගැනීම සම්බන්ධයෙන් සංස්ථාව විසින් නඩුවක් ගොනු කර තිබේ. නීතිපති දෙපාර්තමේන්තුව නඩුව වෙනුවෙන් පෙනී සිටියි.
02	36/17 බදුල්ල මහේස්ත්‍රාත් අධිකරණය	03/07/2017	මහියංගණය කම්හල ඉඩම නීතිවිරෝධී ලෙස අත්පත්කරගැනීම සම්බන්ධයෙන් සංස්ථාව විසින් මෙම නඩුව පවරන ලදී.
03	42/19 බදුල්ල මහාධිකරණය	03/04/2019	පළුදු වූ උළු නිකුත්කිරීම වෙනුවෙන් සංස්ථාවට විරුද්ධව මෙම නඩුව ගොනුකර තිබේ. මහාධිකරණය වෙත අභියාචනයක් ගොනු කර තිබේ.
04	(46/kuli/07/2017) HCA(LT)03/19	21/10/2019	කුලියාපිටිය මහාධිකරණය
05	10286 මහේස්ත්‍රාත් අධිකරණය	20/07/2012	මෙම නඩුව පළුදු වූ උළු සැපයීම සම්බන්ධයෙන් වන අතර ඒ සම්බන්ධයෙන් තාවකාලික තීරණයක් ගනු ලබන අතර මහාධිකරණයට අභියාචනයක් යොමු කරනු ලැබේ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. IMT/E/CCC/40/2023/FS

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2024 මැයි 16 දින

ලංකා පිහන් කර්මාන්ත සංයුක්ත සමාගම ලැබුනේ 05 JUN 2024 ගණ: 561/3. අල්විටිගල මාවත කොළඹ 07.

සභාපති

ලංකා පිහන් සංස්ථාව

ලංකා පිහන් සංස්ථාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත් : 01. ලේකම් - කර්මාන්ත අමාත්‍යාංශය

02. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } IMT/E/CCC/40/2023/FS ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2024 මැයි 16 දින



සභාපති

ලංකා පිහන් සංස්ථාව

ලංකා පිහන් සංස්ථාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ලංකා පිහන් සංස්ථාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16, 79 (ආ) වගන්තිය ප්‍රකාරව සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇති නමුත්, සංස්ථාව විසින් භාවිතා කරනු ලබන එකතු වටිනාකම රු.4,378,333 ක් වූ වාහන 3ක ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරවු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 16 හි 36 වගන්තිය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ අයිතමයන් ප්‍රත්‍යාගණනය කරන විට එම වත්කම් අයත් වන දේපල පිරියත උපකරණ පන්තිය මුළුමනින් ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද කම්හල් තුනක රු.171,904,375ක් වූ ඉඩම් ප්‍රත්‍යාගණනය වටිනාකමටත් කම්හල් හතරක රු.371,329 ක් වූ ඉඩම් පිරිවැයටත් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) නීත්‍යානුකූල අයිතිය සංස්ථාව සතුව නොමැති කම්හල් 7 ක එකතු වටිනාකම රු.196,072,693 ක් මූල්‍ය ප්‍රකාශවල ඉඩම් හා ගොඩනැගිලි යටතේ දක්වා තිබුණි.

(ඈ) වෑ උඩ කම්හල 2023 සැප්තැම්බර් මාසයේදී මාසික බදු කුලිය රු.166,700 කට වර්ෂ 05 ක බදු කාලයකට ගිවිසුම්ගත වී තිබුණි. එසේ වුවද, බදුකරු විසින් ගිවිසුමගත වූ දිනයේදී ගෙවන ලද රු.7,500,000 ක මුදලම සමාලෝචිත වර්ෂයේ බදු කුලී ආදායම ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම හේතුවෙන් රු.6,833,200 ක් වෙනත් ආදායම් වශයෙන් වැඩිපුර ගිණුම්ගත කර තිබුණි.

(ඉ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ තොගය අඩුවීම රු.8,607,025ක් වුවද රු.8,000,945 ලෙස රු.606,080 ක් අඩුවෙන් ද, වෙළෙඳ හා අනෙකුත් ණය හිමියන්ගේ අඩුවීම රු.9,758,803 ක් වුවද, රු.10,853,479 ක් ලෙස රු.1,094,676 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතු උපලබ්ධියෙන් ලැබුණු රු. රු.8,901,904 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබූ අතර, පොළී නැවත ආයෝජනය ලෙස රු.2,616,513 ක් පමණක් ආයෝජන ක්‍රියාකාරකම් ලෙස දක්වා තිබුණි.

(උ) ස්ථාවර වත්කම් ලේඛනය අනුව ප්‍රධාන කාර්යාලය හා කම්හල් 6 ක වත්කම්වල ශුද්ධ අගය රු.149,381,217 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන අනුව වත්කම්වල ශුද්ධ අගය රු.154,222,526 ක් වූයෙන් රු.4,841,309 ක වෙනසක් නිරීක්ෂණය විය.

(උ) වෙළඳ හා වෙනත් ණයගැතියන්ගෙන් අයවිය යුතු රු.5,946,973 ක ණය ශේෂයෙන් රු.5,848,709 ක් වූ ණය ශේෂය වසර තුනකට වැඩි කාලයක සිට පැවත එන ණය ශේෂයන් වුවද අඩමාණ ණය සඳහා වෙන් කිරීමක් කර නොතිබුණි. එසේ වුවද, මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂ ලෙස දක්වා ඇත්තේ අඩමාණ ණය අඩුකළ පසු ශුද්ධ ශේෂය බව සඳහන් කර තිබුණි.

(ඵ) මූල්‍ය ප්‍රකාශනවල කම්හල් අත්තිකාරම්, තැන්පතු හා කලින් ගෙවීම්වල ඇතුළත් කම්හල් අත්තිකාරම් රු.742,947 ක් වුවත් ඊට අදාල උපලේඛනය අනුව රු.299,147 ක් වූයෙන් රු.443,800ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඒ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව 2023 දෙසැම්බර් 31 දිනට අවසන් නිමි තොග වටිනාකම රු.31,992,794 ක් වුවද විකුණුම් පිරිවැය ගණනය කිරීමේදී අවසන් නිමි තොගයේ වටිනාකම රු.32,480,713 ක් ලෙස රු.487,919 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඔ) හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයේ පෙර වර්ෂයේ ලාභයට කරන ලද රු.11,496,407 ක් වූ ගැලපීම්වලින් රු.10,496,407 ක් වූ ශේෂය සඳහා ජ'නල් සටහන්වල නිවැරදිතාවය තහවුරු කර ගැනීම සඳහා විස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සංස්ථාවේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සංස්ථාවේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන

සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සංස්ථාවේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි

අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ (ආ),(ඇ) හා (ඒ) හි දක්වා ඇති නිරීක්ෂණයන් හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	විස්තරය
(අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ හි I කොටසෙහි 13.2 ඡේදය	සංස්ථාවේ කම්හල් වෙත අනුයුක්ත කර තිබූ වාහන 15ක් අපහරණය කළ යුතු බවට හා තවත් වාහන 8 ක් ධාවන තත්ත්වයේ නොමැති බවට හඳුනාගෙන තිබුණද, රාජ්‍ය ආයතනවල අබලන් වූ වාහන භාවිතයෙන් ඉවත් කිරීමට අදාල මාර්ගෝපදේශ ප්‍රකාරව අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.
(ආ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2021 නොවැම්බර් 16 දිනැති රජය සතු ව්‍යවසායන් සඳහා මෙහෙයුම් අත්පොතේ	
(i) 3.3 ඡේදය	සෑම රජය සතු ව්‍යවසායක් සඳහාම අනුමත කාර්ය මණ්ඩලයක් සමඟ වූ සංවිධාන සැලැස්මක් සකස් කර තිබිය යුතු වුවද සංස්ථාව සඳහා කාර්ය මණ්ඩලය අනුමත කරගෙන නොතිබුණු අතර සංවිධාන සැලැස්මක් සකස් කර නොතිබුණි.
(ii) 5 පරිච්ඡේදය	(i)වාර්ෂික අයවැය සකස් කර රේඛීය අමාත්‍යාංශය හරහා භාණ්ඩාගාර ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2023 වර්ෂය සඳහා අයවැය ලේඛනයක් සකස් කර නොතිබුණි. (ii)අදාල ආයතනය නියමිත ඉලක්ක සපුරා තිබෙද යන්න තක්සේරු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී වරින්වර ආයතනයේ ක්‍රියාකාරිත්වය සමාලෝචනය කළ යුතු වුවද 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ වූ කාර්යයන් ඉටු කිරීමේ ප්‍රගතිය සම්බන්ධව එලෙස කටයුතු කර නොතිබුණි.

(iii) 6.6 ඡේදය	ගිණුම් වර්ෂය අවසන් වී මාස 5 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන ඇතුලත්ව වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවද 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

සංස්ථාව සතු වෑ උඩ කර්මාන්තශාලාව ඇතුළු ඉඩම 2019 ජූලි මාසයේ රු.මිලියන 136.7 කට තක්සේරුකර තිබුණ ද ඒ සම්බන්ධව සැලකිල්ලට ගැනීමක් හෝ සමාලෝචිත වර්ෂයේදී බදු කුලිය තක්සේරුකිරීමක් නොකර ඉඩම වර්ෂ 05 කට බදු දී තිබුණි. තවද, රේඛීය අමාත්‍යාංශය හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා නොගෙන 2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව ලංසු කැඳවීමකින් තොරව එම කර්මාන්තශාලාව ඇතුළු ඉඩම වර්ෂ 5ක බදු කාලසීමාවක් සඳහා රු.මිලියන 10කට තනි පුද්ගලයෙකුට බදු දී තිබුණි.

3. **වෙනත් කරුණු**

(අ) 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය වේ.

(i) 2023 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම නිෂ්පාදනය වැඩිකිරීම, නිෂ්පාදන වියදම ඇතුලු සමස්ථ වියදම අඩුකිරීම, විකුණුම් පරිමාව හා වෙළඳ කොටස වැඩි කිරීම ආදි වශයෙන් ඉලක්ක 10ක් සපුරා ගැනීම සඳහා වූ ක්‍රියාකාරකම් ඇතුලත් කරමින් සැලැස්මක් සකස් කර තිබුණ ද කාර්යසාධනය මැනීම සඳහා වූ ප්‍රධාන කාර්යසාධන දර්ශක හඳුනාගෙන ප්‍රගතිය ඇගයීම් කර නොතිබුණි.

(ii) 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව නිෂ්පාදනය වැඩිකිරීම සඳහා මහියංගනය කම්හල නැවත ආරම්භ කර ඒකක 2,875,000 ක් ද එරගම කම්හලේ ඒකක 3,250,000 ක් ද වශයෙන් ඒකක 6,125,000 ක වාර්ෂික නිෂ්පාදන ඉලක්කයක් කරා

ලහාවීමට අපේක්ෂා කර තිබුණි. 2023 වර්ෂයේ කම්හල් දෙකෙහි නිෂ්පාදනය සම්බන්ධව ලබාගත් තොරතුරු අනුව මහියංගනය හා එරගම කම්හල්වල තත්‍ය නිෂ්පාදනය පිළිවෙලින් ඒකක 231,239 ක් ඒකක 887,205 ක් වශයෙන් ඒකක 1,118,444 වී තිබුණි. ඒ අනුව අපේක්ෂිත වාර්ෂික නිෂ්පාදන ඉලක්කය කරා ලහා වීමේ මට්ටම සියයට 18 ක් වී තිබුණි.

(iii) 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ඔඩ්ඩුසුඩාන් කම්හලේ වැඩ ආරම්භ කර දෛනික පැතලි උළු නිෂ්පාදන ඒකක 5800 ක් හා දෛනික ගඩොල් නිෂ්පාදනය ඒකක 4000 ක් ලෙස පවත්වා ගෙන යාමට අපේක්ෂා කර තිබුණ ද එම කම්හල ආරම්භ කර නොතිබුණි.

(iv) පෙර වර්ෂයට සාපේක්ෂව විකුණුම් සියයට 25 කින් වැඩි කිරීමට අපේක්ෂා කර තිබුණද 2022 වර්ෂයේ රු.90,774,254 ක් වූ විකුණුම් ආදායම 2023 වර්ෂයේදී රු. 65,297,488 ක් දක්වා රු.25,476,766 කින් එනම්, සියයට 28 කින් පහත වැටී තිබුණි. අලෙවි නියෝජිතයින් මඟින් විකුණුම් කිරීමේදී ලබාදුන් සියයට 3 ක් වූ වට්ටම් අනුපාතය සමාලෝචිත වර්ෂයේදී සියයට 20 ක් දක්වා වැඩි කිරීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ආ) එරගම කම්හල සතු භූමියේ අක්කර 3.5 ක කොටසක් පෞද්ගලික අයෙකු විසින් අල්ලාගෙන සිටීම සම්බන්ධ ගැටළුව ද මහියංගනය කම්හල පවතින ඉඩමේ 2015 වර්ෂයට පෙර සිට පවුල් 125 ක්ද, ඇලයාපත්තුව ඉඩම්හි කොටසක්ද පෞද්ගලික අය විසින් භාවිතා කිරීම සම්බන්ධ ගැටළු ද නිරාකරණය වී නොතිබුණි.

(ඇ) බංගදෙණිය කම්හල පිහිටි ඉඩමේ ගොඩනැඟිලි කඩා ඉවත් කර තිබුණු අතර අක්කර 7 රූඩ් 1 පර්චස් 28 ක් වූ ඉඩම නිෂ්කාර්යව පැවතුණි. එමෙන්ම තවත් කම්හල් 5 ක නිෂ්පාදන කටයුතු සිදු නොකිරීම හේතුවෙන් එම කම්හල් පිහිටි ඉඩම් හා ගොඩනැඟිලි ඇතුළු වත්කම් දීර්ඝ කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි.

(ඈ) කම්හල් දෙකක පවතින පිරිවැය රු.1,595,537 ක වාහන සම්බන්ධයෙන් විස්තරාත්මක තොරතුරු ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුලත් කර නොතිබුණි.

(ඉ) 2012 වර්ෂයේ සිට පැවත එන ලංකා ඛනිජ වැලි සමාගමට ගෙවිය යුතු රු.387,275,583ක් වූ මුදල හා වසර ගණනාවක සිට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට බදු වර්ග 6ක් සඳහා ගෙවිය යුතු එකතුව රු.121,768,339 ක් වූ ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 2004 වර්ෂයේ සිට 2022 දක්වා වූ කාලයට අදාළ රු.2,644,009 ක විගණන ගාස්තු නිරවුල් කර නොතිබුණි.

(උ) 2023 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් හා තැන්පතු වටිනාකම රු.11,210,604 ක් වූ අතර, එම වටිනාකම තුල ඇතුලත් ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන් අය විය යුතු රු.5,000,000 ක ශේෂයක් ද, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් අය විය යුතු රු.1,221,666ක ශේෂයක් ද, දීර්ඝ කාලයක සිට අය කර ගෙන නොතිබුණි.

(ඌ) අයවිය යුතු වෙනත් තැන්පතු වටිනාකම රු.2,611,875 ක් වූ අතර, ඉන් වර්ෂ 03 ඉක්ම වූ කම්හල් තුනක රු.1,278,224 ක් වූ ශේෂය අයවිය යුතු පාර්ශවයන් හෙලිදරව් කර නොතිබුණි.

(එ) එකතු වටිනාකම රු.41,555,490 ක් වූ වෙළඳ හා අනෙකුත් ණයහිමි ශේෂයේ ඇතුළත් ආයතන දෙකකට ගෙවිය යුතු රු.32,319,927 ක් වූ ණය ශේෂය වසර තුනකට වඩා පැරණි ණය ශේෂයක් වුවද එය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති